# අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය
## (උසස් අධ්‍යාපන අංශය)
## ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලයීය නගර සංවර්ධන ව්‍යාපෘතිය
# ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය

# ඇබෑර්තු (කොන්ත්‍රාත් පදනම මත)

සෞදි අරාබි රජයේ මූල්‍ය ප්‍රතිපාදන මත ක්‍රියාත්මක වන, මුළු වටිනාකම දළ වශයෙන් ඇමරිකානු ඩොලර් මිලියන 28 ක් වන, අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශයේ (උසස් අධ්‍යාපන අංශය) නිරීක්ෂණය යටතේ ක්‍රියාත්මක වන වයඹ විශ්වවිද්‍යාලයීය නගර සංවර්ධන ව්‍යාපෘතියේ (WUTDP) ඉතිරි ව්‍යාපෘති කටයුතු සිදු කිරීම සඳහා එහි පවතින පහත සඳහන් තනතුර සඳහා සුදුසුකම් ලත් ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද 2026/03/28 දිනැති අංක 02/2026 දරන චක්‍රලේඛයේ විධිවිධාන හා ඊට අදාළ සංශෝධනවලට අනුකූලව ඉහත ව්‍යාපෘතියේ ව්‍යාපෘති කළමනාකරණ ඒකකය, කුලියාපිටිය, ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාල පරිශ්‍රයේ ස්ථාපිත කර ඇත.

| තනතුර | වැටුප් කාණ්ඩය | ඇබෑර්තු සංඛ්‍යාව |
|---|---|---|
| **කළමනාකරණ සහකාර** | MSC අංක 02/2026 හි 3.2.3 උපවගන්තියට අනුව | 02 |

2026/03/28 දිනැති අංක 02/2026 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයට අනුව ඉහත තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය මූලික සුදුසුකම් සහ අදාළ වන පොදු කොන්දේසි පහත පරිදි වේ :

**කළමනාකරණ සහකාර - (තනතුරු 02)**

**ඉහත තනතුර සඳහා අවශ්‍ය මූලික සුදුසුකම් පහත පරිදි විය යුතුය:**

1. අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගය එක් වරකදී සිංහල / දෙමළ / ඉංග්‍රීසි සහ ගණිතය ඇතුළුව විෂයයන් හතරකට (04) සම්මාන සාමාර්ථ සහිතව විෂයයන් 06 කින් සමත් වී තිබිය යුතුය.

   සහ

2. අ.පො.ස. (උසස් පෙළ) විභාගය එක් වරකදී (පොදු සාමාන්‍ය පරීක්ෂණය හැර) සියලුම විෂයයන් සමත් වී තිබිය යුතුය. පැරණි විෂය නිර්දේශය යටතේ එක් වරකදී විෂයයන් තුනක් (03) සමත් වීම මේ සඳහා ප්‍රමාණවත් වේ.

**පොදු කොන්දේසි**

අයදුම්පත් භාරගන්නා අවසාන දිනට හෝ ඊට පෙර එක් එක් අයදුම්කරු විසින් තනතුරට අදාළ සියලුම මූලික සුදුසුකම් සපුරා තිබීම අනිවාර්ය වේ.

**වයස් සීමාව :** වයස අවුරුදු 64 ට අඩු විය යුතුය.

**වැටුප් පරිමාණය :**

2026/03/28 දිනැති අංක 02/2026 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛය සහ අදාළ සංශෝධනවලට අනුව අදාළ තනතුරට හිමි වැටුප් පියවර සහ 2026/03/28 දිනැති අංක 02/2026 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛය ප්‍රකාරව රජය විසින් අනුමත කරන ලද සියලුම දීමනා ගෙවනු ලැබේ.

**සේවා කොන්දේසි :**

ආරම්භයේදී කොන්ත්‍රාත් පදනම මත වසරක කාලසීමාවක් සඳහා පත් කරනු ලබන අතර, කාර්ය සාධනය සහ සේවා අවශ්‍යතාවය සලකා බලා සේවා කාලය වාර්ෂිකව දීර්ඝ කරනු ලැබේ.

**අනෙකුත් ප්‍රතිලාභ :**

සේවකයා විසින් තම වැටුපෙන් 8% ක් සහ සේවායෝජකයා විසින් වැටුපෙන් 12% ක් සේවක අර්ථසාධක අරමුදල (EPF) සඳහා දායක කරනු ලබන අතර, සේවා යෝජකයා විසින් වැටුපෙන් 3% ක් සේවක භාරකාර අරමුදල (ETF) සඳහා දායක කරනු ඇත.

**අයදුම් කළ යුතු ආකාරය :**

සුදුසුකම්, පළපුරුද්ද සහ අනෙකුත් අදාළ තොරතුරු පිළිබඳ සම්පූර්ණ විස්තර ඇතුළත් කර තමා විසින්ම සකස් කරන ලද අයදුම්පත, අධ්‍යාපන සුදුසුකම් හා වෘත්තීය පළපුරුද්දට අදාළ සහතික පත්වල පිටපත් සහ ඥාතීන් නොවන නිර්දේශකයින් දෙදෙනෙකුගේ (02) සම්බන්ධ කරගත හැකි විස්තර ද සමග 2026.08.10 දිනට හෝ ඊට පෙර ලැබෙන සේ ව්‍යාපෘති අධ්‍යක්ෂ, වයඹ විශ්වවිද්‍යාලයීය නගර සංවර්ධන ව්‍යාපෘතිය, ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය, ලයනල් ජයතිලක මාවත, කුලියාපිටිය යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම් කරන තනතුර ලියුම් කවරයේ ඉහළ වම්පස කෙළවරේ පැහැදිලිව සඳහන් කළ යුතුය. දැනටමත් රජයේ / අර්ධ රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් තම අයදුම්පත් අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානීන් මාර්ගයෙන් එවිය යුතුය.

**ව්‍යාපෘති අධ්‍යක්ෂ,**
**වයඹ විශ්වවිද්‍යාලයීය නගර සංවර්ධන ව්‍යාපෘතිය,**
**ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය, කුලියාපිටිය.**
**දිනය : 2026/07/16**